# ළමා අක්මා බද්ධය සඳහා විදෙස් ගත වූ කාලය අවසන්

## රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ අක්මා ඒකකය ඒ සඳහා සීරුවෙන්

දරුවන්ට අක්මාව ආශ්‍රිත රෝග සහ ඒ ආශ්‍රයෙන් අවසානයේ ඇතිවන සිරෝසීස් තත්ත්වය පිළිබඳ අප ඔබව දැනුවත් කළා මතක ඇති. මෙවර අපේ අවධානය අක්මා බද්ධය සම්බන්ධයෙනි. අක්මා බද්ධය වැඩිහිටියන්ට මෙන්ම දරුවන්ට ද අවශ්‍ය විය හැකියි.



කිශානු දැරිය සැත්කමින් මාස 3කට පසු

සිරෝසීස් තත්ත්වය මත අක්මාව අකර්මණ්‍ය වීම මෙන්ම හදිසියේ ඇතිවන අක්මා අකර්මණ්‍යතා නිසා (Accute liver falier) අක්මා බද්ධයන් කරන්නට සිදුවේ. අක්මා බද්ධය දියුණු රටවල අවුරුදු 30-40 ක් තරම් ඈතට දිව යයි.

අපේ රටේ වැඩිහිටියකුට අක්මා බද්ධයක් මෙරටදී සිදුවූයේ මීට වසර දහයකට දෙළහකට පමණ පෙර කොළඹ ජාතික රෝහලේ දී ය.

පසුගිය වසරේ ජූලි මස 14 දා රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ අක්මා බද්ධ කිරීමේ ඒකකයේ දීය.

දරුවකුට අක්මාවක් බද්ධ කිරීමේ කටයුත්ත සිදුවූයේ මෙරට දී සිදු කළ පළමු ළමා අක්මා බද්ධය ලෙස ඉතිහාසයට එක්වෙමිනි.

නම හැවිරිදි කිශානු නමැති දැරිවිය මෙසේ පළමු ළමා අක්මා බද්ධයට එක්වෙමින් දැන් ඉතාම සුවදායක ලෙසින් සිටියි. සිරෝසීස් තත්ත්වයෙන් පීඩා විඳි ඇගේ අක්මාව එලෙස අකර්මණ්‍යතාවට පත් වූයේ ජානගතව පැවත ආ තත්ත්වයක් නිසායි.

මෙතෙක් දරුවන්ගේ අක්මා බද්ධයන් සිදුවූයේ විදෙස් රටවලට දරුවන් රැගෙන යාමෙනි.

ඒ සඳහා විශාල මුදලක් වැය කරමිනි. විශේෂයෙන්ම අපේ අසල්වැසි රටවන ඉන්දියාව ඒ සඳහා විශාල සහයෝගයක් ලබා දුනි. එහෙත් ඒ සඳහා ලක්ෂ 80-100 අතර මුදලක් වැය විණි.සාමාන්‍ය පසුබිමක සිටින පවුලකට මෙය දරා ගත නොහැකි මුදලකි. දරුවන් සියයක් අතුරින් දරුවන් පහ ත් - දහය ත් අතර ප්‍රමාණයක් දැඩි අසීරුවෙන් මේ මුදල සොයා ගත්තත් ඉතිරි දරුවන් අනූවට ම සිදුව ඇත්තේ නිකරුණේ මියැදෙන්නටයි.

රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ අක්මා ඒකකය හා අක්මා බද්ධ කිරීමේ ඒකකය සෑම දෙනාගේම සහයෝගයෙන් ඇරැඹෙන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසටයි.

එය වසර දෙළහක පමණ අතීතයකට දිවයයි. මෙම ඒකකයේ වෛද්‍යවරුන්, විශේෂඥ වෛද්‍යවරුන්, ශල්‍ය වෛද්‍යවරුන් එක්ව මේවනවිට වැඩිහිටියන් සඳහා අක්මා බද්ධයන් පනහකට අධික ප්‍රමාණයක් සිදු කර තිබේ.

එවන් පසුබිමක එලෙස ලත් අත්දැකීම් ඇසුරින් කළ පළමු ළමා අක්මා බද්ධය අති සාර්ථක එකක් බවට පත්වෙයි.

### දරුවකුට අක්මා බද්ධයක් අවශ්‍ය වන්නේ කුමන අවස්ථාවක ද?

සිරෝසීස් තත්ත්වයට පත් වීම නිසා අක්මාව අකර්මණ්‍ය වුවහොත් අක්මා බද්ධයක් කරන්නට ම වේවි.

මීට අමතරව හදිසියේ ඇතිවන අක්මා අකර්මණ්‍යතාවක් නිසා ද අක්මා බද්ධයක් අවශ්‍ය වේවි.







### අක්මා බද්ධයක් සිදු වන්නේ කොහොමද?

මෙහිදී දරුවාගේ රෝගීවූ අක්මාව එහෙම පිටින් ම ශරීරයෙන් ඉවත් කළ යුතුවේ. ඉන්පසු දානය කරන අයකුගේ අක්මා කොටසක් දරුවාගේ ශරීරයේ තැන්පත් කළ යුතුවේ. මේ දරුවා වයස අවුරුදු 16 ට වැඩි නම් හා බරෙහි අවශ්‍යතාව අනුව තැම්පත් කරන අක්මා කොටසේ ප්‍රමාණය තීරණය වේවි.



## ළමා සුව මඟ

### අක්මාවක් දානය කරන්නේ කවුරුන් ද?

අක්මාව දන්දීම ජීව දායකයකුට කළ හැකියි. දරුවාගේ මවට, පියාට, එහෙමත් නැත්නම් ඥාතියකුට මෙය කළ හැකියි. අවශ්‍ය වන්නේ රුධිර ගණය ගැළපීම සහ අක්මාවෙන් කොටසක් දානය කරන කෙනා අක්මාවේ තෙල් තැන්පත් වූ අයකු නොවීම (Fatty Liver) යි. අක්මාව දානය කරන්නාට සියයට හැටක පමණ ප්‍රමාණයක් ඉතිරි කොට සියයට තිහක හතළිහක ප්‍රමාණයක් දරුවාට ලබා දේ. අක්මාවට ලියැලීමේ විශාල හැකියාවක් පවතී. ඒ අනුව දෙදෙනාගේම අක්මාවන් ලියළා යථා තත්ත්වයට පත්වේ.

### මොළය මිය ගියේ නම්

මියගිය පසු ඔබේ අවයව දන් දීමට ඔබේ කැමැත්ත ප්‍රකාශ කර සිටිය හැකියි. ඔබේ පවුලේ අයට ඒ වෙනුවෙන් කටයුතු කළ හැකියි. මින් අදහස් කරන්නේ මොළය මිය ගිය අයයි. දැඩි සත්කාර ඒකකයේ සිටියදී ඒ බව වෛද්‍යවරුන්ට කල් තියා දැනුම් දී තිබීම වැදගත්. එවිට ඔවුන් එම අවයවය පිළිබඳ සැලකිලිමත් වෙමින් එහි ගුණාත්මක බව රැක ගැනීමට කටයුතු කරාවි. එවන් අයකුගේ අක්මාවක් හෝ එහි කොටසක් අවශ්‍ය අයකුට බද්ධ කරාවි. නිකරුණේ අවයව විනාශ වනවාට වඩා තවත් කෙනකුට ජීවයක් දීමට මෙය මහෝපකාරී වේවි.

මෙරට දී කළ පළමු ළමා අක්මා බද්ධය සඳහා අක්මාවේ කොටසක් ලබා දුන්නේ එම දැරියගේ මවයි. නිරෝගී අයකු අක්මාවේ කොටසක් දානය කරද්දී ඒ කෙනාගේ ජීවිතයට ද යම් අනතුරක් තිබිය හැකිය. ශල්‍යකර්ම දහසක් කළොත් දෙදෙනකුට හෝ තිදෙනකුට ජීවිත අනතුරක් පවා තිබෙන්නට පුළුවන් වේවි. එවැන්නක් වළක්වා ගැනීමට හැකි සියලුම කටයුතු වෛද්‍යවරුන් මහත් පරිශ්‍රමයෙන් යුතුව දරයි.

අක්මාව දානය කරන්නාගේ දියවැඩියාව, කොලෙස්ටරෝල් මට්ටම. ඕර්ඩි අගය යනාදිය පරීක්ෂා කරයි. ස්ථුල බවින් වැඩි අය බොහෝවිට ටචබබර තඑමඥප තත්ත්වයේ සිටින නිසා ඔවුන්ට අක්මාව දානය කළ නොහැකියි.

තමා ගේ දරුවා අක්මා රෝගයකින් පෙළේ නම් කවදා හෝ දිනෙක අක්මාව දානය කිරීමට සිදුවුවහොත් යන වාතාවරණයේ හිඳිමින් මව, පියා යන අය සිරුර සාමාන්‍ය තරමට පවත්වා ගෙන යා යුතුයි. දියවැඩියාව ඇතුළු රෝග තත්ත්වයන්ගෙන් ආරක්ෂා වී සිටිය යුතුයි. එසේ නොවුණහොත් තම දරුවාට ම අක්මාවේ කොටසක් දානය කිරීමට තිබූ අවස්ථාව මඟ හැරී යයි.

තම ඥාතියකුට අක්මාවේ කොටසක් දානය කිරීමට කෙනකු ඉදිරිපත් වන්නේ නම් රාගම රෝහලේ අක්මා බද්ධ කිරීමේ ඒකකය හා සම්බන්ධ විය හැකියි.

මෙය කෙනකුට ජීවිත දනයක් දුන්නා හා සමාන වූ අතිශය පින්බර අවස්ථාවකි.

**උපදෙස්**: රාගම ශික්ෂණ රෝහලේ, ළමා අක්මා ඒකකයේ, ළමා රෝග විශේෂඥ වෛද්‍ය, රාගම වෛද්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය **මෙරන්ති ප්‍රනාන්දු**



සටහන

**ආශිර්වාදිනි හෙට්ටිආරච්චි**